# බුද්ධඝෝෂාචාරීන්ගේ නවංග සත්ථුසාසන විග්‍රහයේ ශාස්ත්‍රීයත්වය පිළිබඳ විමර්ශනයක්

වළවාහැංගුණවැවේ මහින්දරතන හිමි.

## ප්‍රවේශය

මුළු මහත් බුද්ධ දේශනාව ත්‍රිපිටකය වශයෙන් සංග්‍රහ වීමට පෙරාතුව 'අංග' වශයෙන් කොටස් නවයකට බෙදී පැවති බව සූත්‍රාගත ඇතැම් සඳහන්වලින් හා අට්ඨකථාගත ඇතැම් විස්තරාර්ථ කථනයන් තුළින් මොනවට ගම්‍ය වේ. එම වර්ගීකරණය **'නවංග සත්ථුසාසනය'** ලෙසින් හැඳින්වේ. **'නවංග බුද්ධ ශාසනය'** ලෙසින් ගැනෙන්නේද එයමය.

සූත්‍ර පිටකාගත ඇතැම් සූත්‍ර දේශනා තුළ හා විනය පිටකාගත ඇතැම් කාණ්ඩ තුළ මේ සම්බන්ධයෙන් නාමමාත්‍රිකව සඳහන් වෙතත් ඒ කිසිදු අවස්ථාවක විස්තරයක් ඉදිරිපත් නොවේ. උදාහරණ ලෙස මජ්ඣිමනිකායේ මූලපණ්ණාසකයේ එන අලගද්දූපම සූත්‍රය තුළ **'නවංග සත්ථු සාසනය'** දක්වා ඇති අයුරු ඉදිරිපත් කළ හැකිය.

**"ඉධ භික්ඛවෙ එකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති.."**[1]

පාරාජිකාපාලියෙහි වේරඤ්ජ කාණ්ඩයෙහි ද **'නවංග සත්ථු සාසනය'** දක්වා ඇති අයුරු පහත දැක්වෙන උද්ධෘතයෙන් නිරූපණය වේ.

**භගවා ච සාරිපුත්ත කකුසන්ධො භගවා ච කොණාගමනො භගවා ච කස්සපො අකිලාසුනො අහෙසුං සාවකානං විත්ථාරෙන ධම්මං**

**දෙසෙතුං බහුං ච නෙසං අහෙසුං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භූතධම්මං වෙදල්ලං** [2]

මෙහිදී ධර්ම කරුණු නොදැක්වෙන අතර බාහිර ස්වරූපය පමණක් ඉදිරිපත් කොට ඇත. නව යන්නෙන් නවයක් වූ සංඛ්‍යාව ද, අංග යන්නෙන් කොටස ද ගැනේ. කෙසේ වෙතත් මෙම බෙදීම ඓතිහාසික වර්ගීකරණයක් බව පිළිගැනෙන අතර මේ තුළින් බුදුන් වහන්සේ විසින් දේශිත ධර්ම විනය දෙක අර්ථවත් වේ.

ඒ පිළිබඳව විස්තර දැක්වෙනුයේ අටුවා ග්‍රන්ථ තුළ ය. අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විනයට්ඨ කථාව වූ සමන්තපාසාදිකාවෙහි ඒ බව දක්වා ඇත්තේ මෙසේ ය. "**කථං අංග වසෙන නවවිධං සබ්බමෙවහිදං සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භූතධම්මං වෙදල්ලන්ති නවප්පභෙදං හොති**"[3] වශයෙනි. බැලූ බැල්මට මෙම කොටස් නමයෙහි ස්වරූපය හා ආකෘතිය මත මෙම බෙදීම සිදු කොට ඇති බව පෙනී යයි.

| | |
|---|---|
| සුත්ත | - ගද්‍ය ස්වරූපයෙන් වූ බුදුරජාණන් වහන්සේගේ දේශනා. |
| ගෙය්‍ය | - ගද්‍ය පද්‍ය දෙකින් මිශ්‍රිත වූ උපදේශාත්මක දේශනා |
| වෙය්‍යාකරණ | - විවරණ හා අර්ථකථන |
| ගාථා | - පද්‍ය දේශනා |
| උදාන | - ප්‍රීති වාක්‍ය |
| ඉතිවුත්තක | - කෙටි කියමන් |
| ජාතක | - බෝධිසත්වයන් වහන්සේගේ පෙර භවයන් සම්බන්ධ කථා ප්‍රවෘත්ති |
| අබ්භූතධම්ම | - විශ්මිත බලයන් සම්බන්ධයෙන් වූ විස්තර |
| වෙදල්ල | - ප්‍රශ්නෝත්තර ක්‍රමය රැගත් පණිවුඩ. |

'**නවංග සත්ථුසාසන**' නම් මෙම වර්ගීකරණය තුළ බුද්ධඝෝෂ හිමියන් විසින් ඉදිරිපත් කොට ඇති විස්තරයට අනුව, අංග නවයෙහි



අන්තර්ගතය ඉතාමත් කෙටියෙන් ඉහත දැක් වූ ක්‍රමයට හඳුනා ගත හැකිය.

## අටුවාවෙහි දැක්වෙන 'නවංග සත්ථුසාසනය'

මෙහිදී පළමුව අටුවාචාරීන් විසින් අටුවා ග්‍රන්ථ තුළ දක්වා ඇති '**නවංග සත්ථු ශාසනය**' පිළිබඳව තත් වූ පරිද්දෙන් දක්වා දෙවනුව ඔවුන්ගේ අර්ථකථනයන්හි යුක්තාර්ථවත් බව විමසීමට අදහස් කෙරේ.

**සුත්ත:-**

සුත්ත යන්න විස්තර කරමින් සමන්තපාසාදිකාවේ දී බුද්ධඝෝෂ හිමියන් ඒ බව සඳහන් කරන්නේ "**තත්ථ උභතොවිභංගනිද්දෙසඛන්ධකපරිවාරා සුත්තනිපාතෙ මංගලසුත්ත, රතනසුත්ත නාලකසුත්ත තුවටක සුත්තානි අඤ්ඤම්පිච සුත්තනාමකං තථාගතවචනං සුත්තන්ති වෙදිතබ්බං**"[4] වශයෙනි. එම ප්‍රකාශයට අනුව ඛන්ධක හා පරිවාර ඇතුළත් විනය පිටකයට අයත් සියලු කොට්ඨාශයනුත් චුල්ලනිද්දෙස, මහා නිද්දෙස නමින් දෙකක් වූ ඛුද්දක නිකායට අයත් නිද්දෙස පාලියත්, එමෙන්ම සුත්ත නිපාතයේ, මංගල, රතන, නාලක, තුවටක යන සූත්‍රයනුත් එමෙන්ම සූත්‍ර නාමය රැගත් බුදුරජාණන් වහන්සේගේ සියලු දේශනාත් මෙම සුත්ත නම් කොටසට අයත් ය.

**ගෙය්‍ය :-**

ගෙය්‍ය යන්න විස්තර කිරීමේදිද සුත්ත යන්නට සමාන අර්ථ කථනයක් බුද්ධඝෝෂ හිමියන් විසින් දක්වා ඇත. "**සබ්බම්පි සගාථකං සුත්තං ගෙය්‍යන්ති වෙදිතබ්බං. විසෙසෙන සංයුත්තකෙ සකලොපි සගාථක වග්ගො**"[5] යනුවෙන් ඒ බව සමන්තපාසාදිකාවේ දක්වා ඇත. සුත්ත යන්න යටතේ දැක්වූ සූත්‍ර දේශනා අතුරෙන් සූත්‍රය මධ්‍යයේ වුව,

අවසානයේ වුව ගාථාවන්ගෙන් සමන්විත දේශනා මෙම 'ගෙය්‍ය' නම් වූ කොටසට ඇතුළත් ය. එනයින් බලන කල බොහෝ සූත්‍ර දේශනා මෙම කොටසට අයත් වේ. තවද සංයුක්තනිකායේ සගාථක වර්ගයම අවශ්‍යයෙන් අන්තර්ගත බව අවධාරණය කොට ඇත.

**වෙය්‍යාකරණ:-**

**"සකලං අභිධම්ම පිටකං නිග්ගාතකං සුත්තං යඤ්ච අඤ්ඤම්පි අට්ඨහි අංගෙහි අසංගහිතං බුද්ධවචනං තං වෙය්‍යාකරණන්ති වෙදිතබ්බං."**[6]

බුද්ධඝෝෂ හිමියන්ට අනුව මුළු අභිධර්ම පිටකයම මෙම වෙය්‍යාකරණ නම් කොටසට අයත්ය. එමෙන්ම ගාථා රහිත සූත්‍රයනුත් තවද අනෙකුත් අංග අට සඳහා ගණන් නොගැණුනු සියලු ඉතිරි වූ කොට්ඨාශයනුත් මෙම කොටසට අයත්ය. එබැවින් ශ්‍රාවක භාෂිත වශයෙන් පවතින බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයින් විසින් දේශිත සූත්‍ර දේශනාවන් ද තවද බුදුරජාණන් වහන්සේ විසින් කෙටියෙන් දේශනා කොට එම දේශනාව විස්තරාර්ථ වශයෙන් මහාකච්චායනාදීන් විසින් දේශිත දේශනාවන්ද මෙම වෙය්‍යාකරණ නම් කොටසට ඇතුළත්ය. විශේෂයෙන් මජ්ඣිම නිකායේ විභංග වග්ගයට අයත් සූත්‍ර දේශනා දහයම එවැනි විස්තරාර්ථ කථන රැගත් දේශනාවන්ය.

**ගාථා :-**

බුද්ධඝෝෂ හිමියන් මෙහිදී තරමක් දුරට සාධාරණයක් ඉටු කර ඇති බව දක්නට ලැබේ. **"ධම්මපදං ථෙරගාථාථෙරීගාථා සුත්තනිපාතෙ නො සුත්තනාමිකා සුද්ධිකගාථාච ගාථාති වෙදිතබ්බා"**[7] සමන්තපාසාදිකාවේ දක්නට ඇති පරිදි ධම්මපදයත් ථෙර ථෙරී ගාථාවනුත් තවද සුත්ත නිපාතය තුළ ඇති සූත්‍ර නාමය නොගත්



ගාථාවන් පමණක් ඇතුළත් යම් දේශනාවක්ද යන සියල්ල ගාථා යන අංගයට ඇතුළත් වේ.

**උදාන:-**

බුද්ධ දේශනාව තුළ විසිරී පැවති අව්‍යාජ ප්‍රකාශනයන්, සතුටු සහගත උදානයන්, ආනුභවික කියමන් මෙම උදාන යන අංගය යටතට ගෙන ඉදිරිපත් කොට ඇති අයුරු දක්නට ලැබේ.

**"සොමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා ද්වෙ අසීති සුත්තන්තා උදානන්ති වෙදිතබ්බං"**[8] සොම්නස මුල් කරගත් සතුටු සහගත සිතින් උපන් අසූදෙකක් වූ සූත්‍ර දේශනාවන් මෙම අංගයෙහිලා ගැනේ. ත්‍රිපිටක සාහිත්‍ය තුළ වූ උදාන පාලිය මෙයින් අර්ථවත් කෙරේ.

**ඉතිවුත්තක :-**

මෙහිදීද බුද්ධඝෝෂ හිමියන් උත්සහ දරා ඇත්තේ පසුකාලීනව ශත වර්ෂ ගණනකට පසුව නිමාවට පත් ඉතිවුත්තක පාලිය මෙහිලා අන්තර්ගත කිරීමටය. **"වුත්තං හෙතං භගවතා ති ආදිනයප්පවත්තා ද්වාදසුත්තරසතසුත්තන්තා ඉතිවුත්තකන්ති වෙදිතබ්බං"**[9] 'වුත්තං හෙතං භගවතා' යන ප්‍රකාශනය රැගත් සූත්‍ර දේශනාවෝ, ත්‍රිපිටකය තුළ ඉතිවුත්තක පාලියෙහිලා සංග්‍රහිතය. එකසිය දොළසක් වූ එම සූත්‍ර දේශනාවෝ මෙහිදී හයවන අංගය හැටියට අන්තර්ගත කොට තිබේ. එහෙත් මෙහිලා දක්වන සූත්‍ර දේශනාවන් අතුරෙන් ඇතැම් සූත්‍රවල මූලික ලක්ෂණය වූ " භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලදි" යන ප්‍රකාශය අන්තර්ගත කොට නැත.

**ජාතක:-**

**"අපණ්ණක ජාතකාදීනි පඤ්ඤාසාධිකානි පඤ්ච ජාතකසතානි ජාතකන්ති වෙදිතබ්බං"**[10] ඉහත දැක් වූ බුද්ධඝෝෂ හිමියන්ගේ ප්‍රකාශය

අනුව අපණ්ණක ජාතකය ආදි වූ පන්සිය පනහක් වූ බෝධිසත්වයන් වහන්සේගේ කථා ප්‍රවෘත්තීන් ජාතක නම් වූ අංගයෙහි ඇතුළත් කරන ලදි.

**අබ්භූතධම්ම :-**

**"චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භූතා ධම්මා ආනන්දෙති ආදී නයප්පවත්තා සබ්බෙපි අච්ඡරිය අබ්භූතධම්ම පටිසංයුත්ත සුත්තන්තා අබ්භූතධම්මන්ති වෙදිතබ්බං"**[11]

ආනන්ද හිමියන් පිළිබඳව හා අනෙකුත් ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳව බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ආශ්චර්ය අද්භූතධර්මයන් හා බුදුන් වහන්සේ පිළිබඳ අනෙක් අය විසින් දක්වන ලද ප්‍රකාශයන් මෙහිලා ගැනේ.

**වේදල්ල :-**

**"චූලවෙදල්ල මහාවෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සංඛාරභාජනීය මහාපුණ්ණම සුත්තාදයො සබ්බෙව වෙදඤ්ච තුට්ඨිඤ්ච ලද්ධා ලද්ධා පුච්ඡිත සුත්තන්තා වෙදල්ලන්ති වෙදිතබ්බා"** [12]

චූල්ල වෙදල්ල සූත්‍රය, මහා වෙදල්ල සූත්‍රය, සම්මාදිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාර භාජනීය, මහා පුණ්ණම ආදි වූ සියලු ඥානය ද, සතුට ද, ලබමින් විචාරන ලදුව දේශිත සූත්‍රාංග වෙදල්ල නම් වේ.

## බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථකථනයෙහි යුක්තාර්ථවත් බව විමසීම.

බුදුරජාණන් වහන්සේගේ දේශනය කොටස් නවයකට බෙදා වෙන්කර ගත් අයුරක් පිටක සාහිත්‍ය තුළ දක්නට ලැබෙන බවත්, එය



ඓතිහාසික වර්ගීකරණයක් වූ බවත් අපි මීට ඉහතදී සාකච්ඡා කළෙමු. නවංගයන් නාමික වශයෙන් එහිදී විද්‍යමාන වන අයුරුද, ඊට අයත් විස්තරය අටුවාව තුළ විද්‍යමාන වන බවද වැඩිදුරටත් උගත්තෙමු. එබැවින් මෙලෙස නවයක් වූ අංගයන් සම්බන්ධයෙන් අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් ස්වකීය අටුවා ග්‍රන්ථ තුළ සාකච්ඡා කොට ඇති බැවින් ඇතැමෙක් එය බුද්ධඝෝෂ හිමියන්ගේම අර්තකථනයක් බවටද කරුණු එක් කරති.

තවද සඳහන් කළ යුතු කරුණක් වන්නේ, බුද්ධඝෝෂ හිමියන්ගේ 'නවංග සත්ථුසාසනය' සම්බන්ධයෙන් වූ අර්ථකථනයේදී උන්වහන්සේ ඉදිරිපත් කරන, යෝජනා කරන ඇතැම් අන්තර්ගතයන් ඒවා අයත් ඇතැම් සන්දර්භයන් තුළ නොපිහිටන බවයි. එබැවින් ඒ සම්බන්ධයෙන් උගතුන් අතර යම් යම් සැක මුසු අවස්ථා මතුව පවතී. එතෙකුදුවත් අප අවබෝධ කර ගත යුතු කරුණක් වනනේ ත්‍රිපිටක සාහිත්‍ය තුළ නාම මාත්‍රිකව සඳහන් වූ මෙම නවංගයන්ට බුද්ධඝෝෂ හිමියන් විසින් අර්ථකථනයක් ඉදිරිපත් කොට ඊට නව්‍යත්වයක් ලබා දුන්නද, උන්වහන්සේට පෙර පහළ වූ හෝ උන්වහන්සේට පශ්චත්කාලීනව හෝ පහළ වූ එකදු උගතෙකු ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී නොමැති බවයි. බුදුරජාණන් වහන්සේ ජීවමාන කල උන්වහන්සේ විසින් කෙටියෙන් පවත්වන ලද ඇතැම් දේශනා විස්තරාත්මකව දේශනා කිරීමෙහි සමත් ශ්‍රාවකයන් වහන්සේලා වැඩ සිටියද, මෙම කාරණාව සම්බන්ධයෙන් ඒ කිසිවෙකුගේ හෝ අවධානය යොමු වී නොමැත. එබැවින් බුද්ධ කාලය තුළ මෙබඳු බෙදීමක් නොතිබුණේද? නොවේනම් තිබුණද එතරම් සැළකිල්ලක් දැක්විය යුතු කරුණක් සේ නොසැළකුණිද? කෙසේ හෝ බුද්ධඝෝෂ හිමියන්ගේ උත්සාහය අතිශය පැසසිය යුතු වැයමකි.

කාරණා එසේ වුවද බුද්ධඝෝෂ හිමියන් විසින් දක්වන ලද අර්ථකථනයේදී උන්වහන්සේ විසින් එතරම් තැකීමකට ලක් නොකොට ඉදිරිපත් කරන ලද අන්තර්ගතයන් ද දක්නට ඇති බව නම් නොකියාම බැරිය.

**සුත්ත ః-** සුත්ත යන අංගය යටතේ බුද්ධඝෝෂ හිමියන් දක්වා ඇති අන්තර්ගතය විමසීමේ දී බෙහෙවින් ගැටළුකාරී තත්ත්වයක් පැන



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

නගී. ඒ අනුව මුළු විනය පිටකයම මීට අයත්ය. සූත්‍ර නමින් ගැනෙන සියළුම දේශනා මේ අංගයෙහිලා ගැනීම වරදක් නෙවෙයි. එහෙත් විනය පිටකය සූත්‍ර යන්නෙහිලා ගණන් නොගන්නා බැවින් එය මීට ඇතුළත් කිරීම තුළ මෙම බෙදීම පිළිබඳ වූ විශ්වාසයට හානි පැමිණ ඇත.

තවද සූත්‍ර නමින් ගැනෙන සියල්ල යනුවෙන් දක්වා විශේෂයෙන් ඊට උදාහරණ වශයෙන් සුත්ත නිපාතයෙහි එන මංගල. රතන, නාලක, තුවටක යන සූත්‍ර දක්වයි. දීඝ නිකාය, මජ්ඣිම නිකාය වැනි ප්‍රධාන නිකාය ග්‍රන්ථයන්හි ඉතා ජනප්‍රිය, අර්ථවත් ධර්ම කරුණු විස්තර කෙරෙන කොතෙකුත් සූත්‍ර දේශනා තිබියදී මෙවැනි කුඩා ගණයෙහි ලා ගැනෙන සූත්‍ර හතරක් උදාහරණ වශයෙන් දැක්වීම නොවටී. තවද ඒවා තුළ ඇත්තේම පද්‍ය දේශනාවන්ය. එබැවින් එම සූත්‍ර හතර ගෙය්‍ය යන්නෙහි හා ගාථා යන්නෙහි ලා අන්තර්ගත කිරීම ඉතාමත් යෝග්‍යය වේ.

**ගෙය්‍ය ඃ-** සංස්කෘත අර්ථකථනයට සමාන අර්ථකථනයක් 'ගෙය්‍ය' යන අංගය සම්බන්ධයෙන් බුද්ධඝෝෂ හිමියන් විසින් මෙහිදී සපයා ඇති බව පෙනේ. තවද 'සුත්ත' යන්නෙහි අනු අංගයක් ලෙස 'ගෙය්‍ය' යන්න වැටී ඇති බව පැහැදිලි වීමෙන් එම බෙදීම තුළද බලාපොරොත්තු වන විශ්වාසයක් ගොඩනැගී නොමැති බව පෙනේ.

**වෙය්‍යාකරණ ඃ-** බුද්ධඝෝෂ හිමියන්ට අනුව මුළුමහත් අභිධර්ම පිටකය මෙහිලා අන්තර්ගතය. එහෙත් මෙය බුද්ධ කාලයෙහි වූ වර්ගීකරණයක් බැවින් එය එතරම් විශ්වාසයෙන් තොරවූවක් ලෙස ගිණිය හැකිය. මන්දයත් අභිධර්මය, පිටකයක් ලෙස සංග්‍රහ වන්නේ පශ්චාත්කාලීනවය. ''අංග අටෙහි නාවාවූ අනෙක් සියල්ලත්" යනුවෙන් දක්වා ඇති බැවින් මෙම පිටකය වෙසෙසා දක්වා ඇත.

එහෙත් සංස්කෘත සම්ප්‍රදායිකයින් මෙම ගැටළුව නිරාකරණය කරගැනීමෙහිලා යම් පමණක උදව්වක් සපයයි. එනම්, ශ්‍රාවකයන් වහන්සේලා විසින් දේශිත සූත්‍ර දේශනා මෙම අංගයෙහි ලා සැළකීමයි. එබැවින් ශ්‍රාවක භාෂිත වශයෙන් පවතින බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයින් දේශිත සූත්‍ර දේශනාවන්ද, තවද බුදුරජාණන් වහන්සේ විසින් කෙටියෙන් දේශනා කොට එම දේශනාවම විස්තරාර්ථ වශයෙන්



මහාකච්චායනාදීන් විසින් දේශිත අවස්ථාවන්ද මෙම වෙය්‍යාකරණ නම් කොටසට ඇතුළත්ය. විශේෂයෙන් මජ්ඣිම නිකායේ විභංග වර්ගයට අයත් සූත්‍ර දේශනා දොළහම එවැනි විස්තරාර්ථ කථන රැගත් දේශනාවන්ය.

**ගාථා ඃ-** මෙහි දී නම් බුද්ධඝෝෂ හිමියන් විසින් යම් සාධාරණයක් මෙම අංගයෙහි ලා සපයා ඇති බව පෙනේ. සුද්ධික ගාථා යන්නෙන් සූත්‍ර නාමය නොගැනෙන දේශනා අදහස් කොට ඇති අයුරක් පෙනේ. කෙසේ හෝ සුත්ත හා ගාථා යන අංග දෙක තුළ කිසියම් පැහැදිළි සීමාවක් ලකුණු කරගෙන නැති බව නම් ඉතා පැහැදිළිය.

**උදාන ඃ-** මෙහි දී ත්‍රිපිටකය තුළ වූ උදාන පාලියම සැලකිල්ලට ගෙන තිබේ. එහි ආවා වූ අසූ දෙකක් (82) ක් වූ ආනුභවික ප්‍රකාශන ඇතුළත් සූත්‍ර දේශනාවන් මෙහිලා අන්තර්ගතය. බුද්ධ භාෂිතය තුළ ඒ ඒ තැන්හි විසිරී පැවති ප්‍රහර්ෂණ වාක්‍යයෝ මෙහිලා නිර්දේශිතය.

**ඉතිවුත්තක ඃ-** මෙහි දී ද බුද්ධඝෝෂ හිමියන් වසර සිය ගණනකට පසු සංවර්ධිත හා පරිපූර්ණතම සූත්‍ර එකසිය දොළහකින් (112) යුත් බුද්ධ භාෂිතයක් එක් කොටසක් තුළ අන්තර්ගත කර දැක්වීමේ උත්සාහයක යෙදී ඇති අයුරු දක්නට ලැබේ. **''වුත්තං හෙතං භගවතා''** **''එවං වුත්තං භගවතා''** ආදී ප්‍රකාශයන් ඇතැම් තැනක ඇති, එමෙන්ම ඇතැම් තැනෙක්හි එම ප්‍රකාශයෙන් තොර උපුටා ගැනීම් මෙහි ලා අන්තර්ගතය. තව ද ඇතැම් සංස්කෘත සම්ප්‍රදායයන් තුළ මෙම ප්‍රකාශනය අර්ථ විකෘති කොට දක්වා ඇත. 'ඉතිවුත්තං' යන්න 'ඉතිවෘත්ත' යනුවෙන් දක්වා ප්‍රධාන ශ්‍රාවකයින් වහන්සේලාගේ පූර්ව ජන්ම කථා ප්‍රවෘත්තීන් ඉදිරිපත් කොට ඇත.

**ජාතක ඃ-** ජාතක කථා පන්සිය පනහක් මෙම අංගය තුළ අන්තර්ගත කිරීමෙහිලා බුද්ධඝෝෂ හිමියන් විසින් නිශ්ඵල උත්සාහයක යෙදී ඇති අයුරක් දක්නට ලැබේ. පද්‍යයෙන් පමණක් සංගෘහිත මෙම ජාතක කථා ජාතකපාළියෙහිලා ගැනේ. එම පද්‍ය දේශනා, උන්වහන්සේගේ අර්ථකථන්යට අනුව නම් ඇතුළත් කළ යුතුව තිබුණේ ''ගාථා'' අංගයෙහිලා ය. ත්‍රිපිටකයෙහි විද්‍යමාන ජාතකකථා මෙහිලා

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

දැක්වූයේ නම් සම්පූර්ණ සාධාරණත්වයක් ඒ තුළ දක්නට පුළුවන්ව තිබුණි. කූටදන්ත, මහාගෝවින්ද, මහාසුදස්සන ආදී දීඝනිකායේ අන්තර්ගත සූත්‍ර දේශනා තුළ මෙම ජාතක කථාවන් සංගෘහිතය. මෙහිදී එවැනි කොටස් අන්තර්ගත කළේ වී නම් මෙය තරමක් දුරට හෝ නිවැරදි වන්නට තිබුණි.

**අබ්භුත ධම්ම** :- මෙහිදී බුද්ධඝෝෂ හිමියන් "අබ්භුත ධම්ම" යනුවෙන් වෙනස් වූ අංගයකට උචිත අන්තර්ගතයක් සෙවීමේ දී කිසියම් අපහසුතාවයකට පත්ව ඇති අයුරක් දක්නට ලැබේ. මන්ද යත් 'අබ්භුතධම්ම' යනුවෙන් වූ කිසියම් අන්තර්ගතයක් ත්‍රිපිටක සාහිත්‍ය තුළද දක්නට නොමැති හේතුවෙනි. බුද්ධඝෝෂ හිමියන් දක්වන්නේ ආශ්චර්ය අද්භූත ධර්ම පර්යායයන් ඇතුළත් ඕනෑම අවස්ථාවක් ඕනෑම සූත්‍රයක දක්නට ඇති ද, ඒ සියල්ලක් මෙහිලා ගණන් ගැනෙන බවයි. උන්වහන්සේගේ උපුටා දැක්වීමට අනුව මහා පරිනිබ්බාණ සූත්‍රයේ පමණක් එවැනි විග්‍රහයන් එයි.

**වේදල්ල** :- සංස්කෘත හෝ පාලි යන සම්ප්‍රදායයන් දෙකම මෙහිලා නිවැරදි අර්ථකථනයක් ඉදිරිපත් කිරීමෙහිලා අපොහොසත් වී ඇති අයුරක් දක්නට ලැබේ. බුද්ධඝෝෂ හිමියන්ට එහිලා තරමක මගහැරීමක් සිදුව ඇති අයුරු පෙනෙන්නට ඇත.

මෙම නවාකාර වූ විභේදනය, බෞද්ධ සාහිත්‍යය නව විධ කොට්ඨාශයන්ට බෙදා වෙන් කිරීමක් ලෙස නොසැලකෙන අතර සැබවින්ම එය සාහිතය තුළ වූ නවවිධ බෙදා දැක්වීමක් පමණි. බෞද්ධ ග්‍රන්ථ සම්පාදනයේ දී මෙබඳු විවිධ ස්වභාවයන් බෞද්ධ සාහිත්‍යය තුළ හමු වන අතර මෙය ද ඒ අතුරින් වූ එක්තරා ක්‍රමයක් පමණි.

'නවංග සත්ථුසාසනය' සම්බන්ධයෙන් අදහස් දැක්වූ උගතුන් අතුරෙහි ඩී. ජේ කලුපහන මහතා සුවිශේෂී විචාරකයෙකි. ඔහු සඳහන් කරන්නේ අංග නවයකට බුද්ධ දේශනාව බෙදා දැක්වීම ඈත අතීතයට දිව යන බවයි. බුදුරජාණන් වහන්සේගේ දේශනය හැඳින්වීම සඳහා භාවිත, 'නවංග සත්ථුසාසන' යන පදයට සමගාමීව **බුද්ධ වචන, පාවචන, ධම්ම විනය** යන පදයන් ද පොදුවේ භාවිත කොට ඇති බව ඔහුගේ අදහසයි. යමෙකු බහුස්සුත පුද්ගලයෙකු වීමට නම් (බහුකං



සුතං) ඔහුට 'නවංග සත්ථු ශාසනය' පිළිබඳ හසල දැනුමක් තිබිය යුතු බව කියවේ.[13] එහෙත් චතුරාර්ය සත්‍යය නිශ්‍රිත විදර්ශනාවෙන් තොර 'නවංග සත්ථුසාසනය' සම්බන්ධයෙන් වූ දැනුම වුව අසම්පූර්ණ තත්වයක් ලෙස සැලකිණ. වරෙක බුදුරජාණන් වහන්සේ විදර්ශනාවෙහි හා බහුශ්‍රැත භාවයෙහි වූ වෙනස පෙන්වා දෙමින් දේශනා කරනුයේ යම් පුද්ගලයෙකු 'නවංග සත්ථුසාසනය' අන්තර්ගත ධර්ම ඥානයෙන් පිරිපුන් වූයේ නමුදු චතුරාර්ය සත්‍යය ධර්ම නිශ්‍රිත විදර්ශනා ඥානයෙන් හීන වූයේ නම් හෙතෙම ගෙරවීම්, විදුලි කෙටීම් පමණක් ඇති, එහෙත් වැසි නොවසින වැසි වළාකුලක් හා සමාන වන බවයි. මුල් බුදු සමය තුළ බුදුරජාණන් වහන්සේගේ ධර්මය කටපාඩමෙන් පවත්වාගෙන යෑම යනු 'නවංග සත්ථුසාසනය' කටපාඩමෙන් රැගෙන යාමයි.

බුද්ධ වචනය සම්බන්ධයෙන් වූ මෙම වර්ගීකරණය සාහිත්‍ය තුළ වූ හුදු බෙදා දැක්වීමක් පමණි. එය මුළු මහත් බෞද්ධ සාහිත්‍ය විවිධ වූ වෙනස් කොටස් නවයකට කළ වර්ගීකරණයක් ලෙස ගණන් නොගැනේ. අතීත බෞද්ධ සාහිත්‍ය තුළ දකින්නට ලැබෙන, ධර්මය පවත්වාගෙන පැමිණි එක්තරා ක්‍රමවේදයක් ලෙස ගැනීම වඩාත් යෝග්‍ය වේ. එකම සූත්‍ර දේශනාවක් වුව. 'නවංග සත්ථුසාසන' විභේදනය අනුව විවිධ කොටස්වලට අයත් කොට දැක්විය හැකිය. උදාහරණයක් ලෙස මහාපරිනිබ්බාණ සූත්‍රය, සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, අබ්භුතධම්ම, ජාතක යන සියලු කොටස්වලට අනුගත කොට දැක්විය හැකිය.

**නිගමනය** :-

මෙලෙස ඉහත එක් එක් අංගයන් සම්බන්ධයෙන් වූ බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථකථනයන් විචාර පූර්වකව පරීක්ෂා කළෙමු. එහිදී වැටහී යන කරුණක් වනුයේ නවංගයන් තුළ නැවත නැවත බහාලනු ලබන්නේ එකම ප්‍රස්තුතයක් බවයි. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ හා ගාථා යන අංගයන් හතරෙහිලා දැක්වූ අන්තර්ගතයන් තුළ බුද්ධ දේශනාවේ සියලුම පර්යායයන් බෙදා දක්වා හමාරය. නැවත උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන අංගයන්හි ලා බාහාලනු ලබන්නේම ඉහත අංගයන්හි ලා දැක් වූ අන්තර්ගතයම වෙනත්

ස්වරූපයකිනි. එබැවින් මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වනුයේ, සූත්‍ර දේශනාවන් තුළ දක්නට ලැබෙන නවංගයන් පිළිබඳ නිදසුන්, උදාහරණ දැක්වීම තුළ බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථකථන න්‍යායෙහි උන්වහන්සේ සතු ප්‍රාගුණ්‍යත්වය මැනවින් නිරූපණය වනවාක් මෙන්ම, එය පැසසිය යුතු කරුණක් වනවාක් මෙන්ම පූර්ව නිදර්ශන උන්වහන්සේට සපයාගත නොහැකි වූ හෙයින් ඇතැම් බොහොමයක් අංගයන්හි ලා ඉදිරිපත් කරන ලද අන්තර්ගතයන් සන්දර්භයට නොගැළපෙන අයුරින්, තේමා නාමය පමණක් ඉලක්ක කර ගනිමින් එතරම් විශ්වාසයකින් තොරව ඉදිරිපත් කොට ඇති බවයි.

උන්වහන්සේ විසින් රචිත අනෙකුත් අටුවා ග්‍රන්ථ හා විශුද්ධි මාර්ගය වැනි දාර්ශනික ග්‍රන්ථයන්ගේ ඉදිරිපත් කිරීමේ තාර්කික හා ශාස්ත්‍රීය ක්‍රමවේදය විමසා බැලීමේ දී නවංග සත්ථු ශාසනය සම්බන්ධයෙන් මීට වඩා සාර්ථක අර්ථකථනයක් ඉදිරිපත් කළ හැකිව තිබූ බව උන්වහන්සේගේ රචනයන්ට, අරුත් ගැන්වීම්වලට ප්‍රිය කරන සෑම විද්‍යාර්ථයෙකුහටම වැටහී යන කරුණකි.

---

1 මජ්ඣිම නිකාය මූලපණ්ණාසක ඕපම්මවග්ග, අලගද්දූපම සූත්‍රය, පිට 334, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.

2 පාරාජිකාපාලි වේරඤ්ජකාණ්ඩ, පිටු 18 - 20, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.

3 සමන්තපාසාදිකා, බාහිරනිදාන වර්ණණා, පිට 16. හේ.මු. 1929

4 එම, පිටු 16, හේ.මු. 1929

5 එම, පිටු 16, හේ.මු. 1929

6 එම, පිටු 16, හේ.මු. 1929

7 එම, පිටු 16, හේ.මු. 1929

8 එම, පිටු 16, හේ.මු. 1929

9 එම, පිටු 16, හේ.මු. 1929

10 එම, පිටු 16, හේ.මු. 1929

11 එම, පිටු 16, හේ.මු. 1929

12 එම, පිටු 16, හේ.මු. 1929

13 අංගුත්තර නිකාය [illegible], 7. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.